# ප්‍රධාන කරුණු ලේඛනය - ආන්තික වෙළඳාම

| නිෂ්පාදනයේ නම | ප්‍රධාන ලක්ෂණ, ප්‍රතිලාභ සහ නිෂ්පාදනයේ ස්වභාවය | ගාස්තු, අයකිරීම් සහ පොලී අනුපාත | පහසුකමක් ලබාගැනීමේදී අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙල | ප්‍රධාන නියමයන් සහ කොන්දේසි | නිෂ්පාදනයට අදාළ නීතිමය ප්‍රතිපාදන | පැමිණිලි පිළිබඳ ක්‍රියා පටිපාටිය |
|---|---|---|---|---|---|---|
| ආන්තික වෙළඳාම | • කොටස් වෙළඳ කටයුතු සඳහා අරමුදල් සපයයි.<br><br>• කොටස් සුරැකුම්පත් වලින් ස්ථාපිත කෙරේ.<br><br>• ආන්තික වෙළඳාමෙහි නිරත ආයෝජකයන්ට ඔවුන්ගේ පවතින කළඹ යොදාගනිමින් වැඩිපුර කොටස් මිලදීගත හැකිවේ | • ගාස්තු ලේඛනය අනුව පොලී අනුපාත ALCO විසින් තීරණය කරනු ලබයි.<br><br>• ALCO විසින් තීරණය කරන ලද ගාස්තු ලේඛනයට අනුව ව්‍යතිරේක (ඇත්නම්) D/CEO විසින් අනුමත කරනු ඇත. | • පහසුකමක් ඉල්ලීම මත පාරිභෝගිකයා සමඟ මූලික සාකච්ඡාව.<br><br>• කොළඹ කොටස් වෙළඳපොලේ ලියාපදිංචි කොටස් තැරැව්කරුවන් සමඟ පොරොන්දු වූ ඔහුගේ /ඇයගේ කොටස් කළඹ සමඟ අවශ්‍ය සියලුම ලියකියවිලි ගනුදෙනුකරු විසින් ඉදිරිපත් කළ යුතුය.<br><br>• කොටස් තැරැව්කරුගේ ගණකාධිකාරී ප්‍රකාශය<br><br>• LOLC ෆිනෑන්ස් නිලධාරීන්ගේ ඇගයීම<br><br>• අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා වැඩකරන දින 3ක් පමණ ගතවේ.<br><br>• ගිවිසුම් සහ කොටස් හුවමාරු පෝරම අත්සන් තැබීම<br><br>• කොටස් තැරැව්කරුට ගෙවිය යුතු සම්පූර්ණ මුදල පියවීම | • ආන්තික පහසුකමක් ලබා ගැනීම සඳහා අයදුම්කරු නීත්‍යානුකූලව පිළිගත හැකි වයස් සීමාවේ ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.<br><br>• අයදුම්කරු වැටුප් ලබන / ස්වයං රැකියාවක නියුතු, ආයතනික හෝ විශ්‍රාමික පුද්ගලයෙකු විය හැකිය.<br><br>• ගනුදෙනුකරුගේ තොරතුරු සමාගමේ ණය නිර්ණායක වලට අනුකූල විය යුතුය<br><br>• සියලුම පහසුකම් අයදුම් ණය ඇගයීම් වලට යටත් වන අතර ඕනෑම පහසුකමක් අනුමත කිරීම සමාගමේ පූර්ණඅභිමතය පරිදිවේ.<br><br>• ගිවිසුමට අනුව ගෙවීම් සිදුනොකරන අවස්ථාවක ඒ සඳහා සමාගම වෙනුවෙන් අය කරනු ලබන සියලුම පොලී ගාස්තු ගෙවීමට ගනුදෙනුකරු බැඳී සිටී. | • 2021 අංක 19 දරන සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත | • ගනුකරුවන්ට පහත පියවර අනුගමනය කිරීමෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැක;<br><br>•පහසුකම ලබා දුන් ශාඛාව වෙත ගොස් කලාප කළමනාකරු හෝ ආන්තික වෙළඳ කළමනාකරු වෙත ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම<br><br>විසඳුමක් නොලැබුණේ නම්;<br><br>• ප්‍රධාන මෙහෙයුම් නිලධාරි LOLC ෆිනෑන්ස් පීඑල්සී 100/1, ශ්‍රී ජයවර්ධනපුර පාර, රාජගිරිය. වෙත ලිපියක් යොමුකරන්න<br><br>ක්ෂණික ඇමතුම් අංකය +94 11 5715555 වෙත ඇමතුමක් ලබාදෙන්න.<br><br>info@lolcfinance.com වෙත ඊමේල් පණිවුඩයක් යොමුකරන්න :<br><br>පැමිණිල්ලක් සිදුකිරීමට අවශ්‍ය තොරතුරු;<br>-නම<br>- ජාතික හැඳුනුම්පත් අංකය<br>- ජංගම දුරකථන අංකය<br>- ඊමේල් ලිපිනය (ඇත්නම්) |